ජාතික යොවුන් සේනාංකයට ආධුනිකයන් බඳවා ගැනීමේ ඉල්ලුම්පත්‍ර අද ගැසට් එකේ

සිළුමිණ

சிழுமின The Silumina

■ ආරම්භය - 1930 මාර්තු 30 ■ ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී ■ 92 වැනි කාණ්ඩය 06 වැනි පත්‍රය ★

■ ශ්‍රී බුධ වර්ෂ 2564ක් වූ මකර රවි 25 භාග දුරුතු අව දසවක ඉරිදා ■ වර්ෂ 2021ක් වූ පෙබරවාරි මස 07 වැනි ඉරිදා මිල රු 80.00

වික්ටර් සහ හෂිනි නිදහසට කරුණු කියයි සිළුමිණ-රසඳුන බලන්න

03

රටම හඬවා නික්ම ගිය දොස්තර

10

රඹකැන්ඔය අක්කරයක් රු. දාහයි

13

ශ්‍රී ලංකාවෙන් ප්ලාස්ටික් සමුගනී

15

'යහපාලනේ' ගිල්ල ස්වාධීන රූපවාහිනිය

17

ඝාතනයෙන් අවසන් වූ අසම්මත පෙම

25

බෙලිඅත්තෙන් කොළඹ එන සාගරිකා

විදෙස් ශ්‍රමිකයන් 22,500ක් ළඟදීම දිවයිනට

කුවේට් 5,000කට ... කම්!

(තාරක වික්‍රමසේකර)

විදෙස්ගත ශ්‍රමිකයන් මෙරටට ගෙන්වීමේ වැඩ පිළිවෙළ කඩිනම් කිරීමේ වැඩ-සටහන යටතේ මැද පෙරදිග විදෙස් ගත ශ්‍රමිකයන් 22,483ක් කඩිනමින් මෙර-

ටට ගෙන්වා ගැ... විදේශ රැකියා ... හා විවිධාංගීකර... ජයරත්න සිළුමි...

ඒ අනුව මැද පෙ... තැනන් ලබා දී ඇ...

... නොමිලේ ... නික සංක්‍ර- ... වා ඇතැයිද ... වැත්ත පළ ... ඛන 9 ... සාකච්ඡා- ... වැනි පිටුවට

CLICK

සඳහිරු සෑයේ වැඩ කඩිනම් වේ!



විසි එක්වන සියවසේ ලොව ඉදිවන විශාලතම දැගැබ වන අනුරාධපුරයේ සඳහිරු සෑයේ ඉදිකිරීම් කටයුතු මේ වසරේ දෙසැම්බර් මස නිම වන අතර එය ඊයේ වන විට අඩි 125ක් දක්වා නිම කර තිබුණි. තිස් වසරක යුද්ධය නිමා කරමින් රට නිදහස් කර ගැනීම වෙනුවෙන් ඉදිවන මේ සෑයේ වැඩ නිම වන විට දාගැබේ උස අඩි 283කි. එය විෂ්කම්භයෙන් අඩි 255කි. යුද්ධයේදී මිය ගිය රණවිරුවන් 27,000ක් අතුරුදන් වූ 4,500ක් හා ආබාධිත වූ 37,000ක් රණවිරුවන් සිහි කිරීම උදෙසා මෙම සෑය ඉදි කෙරේ. සෑය ඉදි කිරීම සඳහා සැදැහැවතුන්ගේ ආධාර, හමුදා සාමාජිකයන්ගේ පරිත්‍යාග සහ ශ්‍රම දායකත්වයද ලබා දෙනු ලැබේ. (ඡායාරූපය - අනුරාධපුර විශේෂ සරත් මනුල වික්‍රම)

අත්‍යවශ්‍ය භාණ්ඩ 27ක මිල අඩු කෙරේ

(නිහාල් පී. අබේසිංහ)

අත්‍යවශ්‍ය භාණ්ඩ 27 ක මිල මාස 03 ක් ඇතුළත කාලයක් සඳහා පහත දැමීමටත් ඒ භාණ්ඩ සතොස, සමුපකාර අලෙවිහල් හා Q - Shop හරහා නොඅඩුව ජනතාවට ලබාදීමටත් රජය තීරණය කළ බව වෙළෙඳ ඇමැති ආචාර්ය බන්දුල ගුණවර්ධන 'සිළුමිණ' ට පැවසීය. >> 3 වැනි පිටුවට

දකුණු ආසියාවේ දිගම වාරි උමගේ ඉදිකිරීම් ඇරැඹේ!

කිලෝ මීටර් 28ක දිගකින් යුත් දකුණු ආසියාවේ දිගම 'වාරි උමගේ' ඉදිකිරීම් පෙබරවාරි 5වැනිදා පෙරවරුවේ අනුරාධපුර පලුගස්වැවදී ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන් අතින් ආරම්භ කෙරිණි. වැව් 5,000ක් ප්‍රතිසංස්කරණය කිරීමේ 'වාරි සෞභාග්‍යා' වැඩසටහනට සමගාමීව ක්‍රියාත්මක උතුරු මැද පළාත් මහ ඇළ ව්‍යාපෘතියේ ප්‍රථම අදියර යටතේ මේ උමඟ ඉදි කෙරේ. මහවැලි සංවර්ධන ව්‍යාපාරයේ අවසන් සැලැස්ම ලෙස උතුරු මැද පළාත් මහ ඇළ ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවේ. වසර 6කින් නිම කිරීමට සැලසුම් කර තිබූ උතුරු මැද පළාත් මහ ඇළ ව්‍යාපෘතිය වසර 4කදී එනම් 2025 වන විට අවසන් කිරීමට රජය කටයුතු යොදා ඇත. මෙම අවස්ථාවට සහභාගි වූ වාරිමාර්ග ඇමැති චමල් රාජපක්ෂ ඉඩම් ඇමැති එස්. එම් චන්ද්‍රසේන, රාජ්‍ය අමාත්‍යවරුන් වන මහාචාර්ය වන්න ජයසුමන සිරිපාල ගම්ලත් ඇතුළු ආරාධිතයන් පිරිසක් මෙහි දැක්වේ.

ලාංකිකයෝ ලක්ෂ 80ක් බැංකුවලට ණය වෙති

(රසික කොටුදුරගේ)

මෙරට පුද්ගලයන් මිලියන 8කට වඩා එනම්, ලක්ෂ 80කට වැඩි පිරිසක් බැංකු හෝ වෙනත් මූල්‍ය ආයතනවලින්, ණය ලබාගෙන ඇති බවත්, මෙරට වැඩිහිටි ජනගහනයෙන් 68.9% ක් ඒ තුළ නියෝජනය වන බව ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ අධ්‍යක්ෂ සාමාන්‍යාධිකාරී නන්දි ඇන්තනි පවසයි.

මෙරට සමස්ත ජනගහනයෙන් බොහෝ පිරිසක් කුමන හෝ බැංකුවකින්, හෝ කිසියම් මූල්‍ය ආයතනයකින් ණයක් ලබාගත් අයවලුන් බව හෙතෙම කියා සිටියේය.

ආදායම අහිමි වන්නන්ට ආරක්ෂණ අරමුදලක්

(තාරක වික්‍රමසේකර)

කොවිඩ් වසංගතය වැනි ආපදා අවස්ථාවන්හිදී රට වසා තබන හෝ වෙනයම් හදිසි ආපදා අවස්ථාවකදී රැකියා ආදායම අහිමිවීම වෙනුවෙන් විශේෂ රැකවරණ වන්දි ක්‍රමයක් මේ වසර තුළදී ආරම්භ කිරීමට සැලසුම් කර ඇතැයි කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා සිළුමිණට කීය.

බොහෝ විදේශ රටවල එවන් ආකාරයේ රැකියා ආදායම් අහිමිවන්නන්ට විශේෂ ආරක්ෂණ රැකවරණයක් ඇති බවත් කොවිඩ් වසංගතය හමුවේ එසේ ආදායම් අහිමි වූවන්ට ඔවුන් ලබන සාමාන්‍ය වැටුපෙන් 80%ක පමණ ප්‍රමාණයක් පසුගිය වසංගත සමයේදී ලැබී ඇතැයිද ඇමැතිවරයා පැවසුවේය.

>> 3 වැනි පිටුවට



ඔබේ ව්‍යාපාරයේ දියුණුවට අවශ්‍ය සේවා සහ මෙවලම් දැන් පහසුම මිලට

011 2389 389